දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) NA/14/04/2022
எனது இல )
My No. )

ඔබේ අංකය)
உமது இல )
Your No. : )

දිනය ) 2023.05. 08
திகதி )
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார் அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක - 01-15/2023

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ජාතික රෝහල
අධ්‍යක්ෂ, මහනුවර ජාතික රෝහල
මධ්‍යම රජයට අයත් සියලුම රෝහල් අධ්‍යක්ෂවරු, වෛද්‍ය අධිකාරිවරු
සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්
ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා හෙද සේවයේ ශ්‍රේණිගත උසස්වීම් ලබා දීම

ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවේ 10 වන සංශෝධනය ලෙස අංක 2325/54 දරණ 2023.03.31 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයට අනුව, හෙද/හෙදි නිලධාරීන්ගේ ශ්‍රේණිගත උසස්වීම් සිදු කිරීමේ දී පහත කරුණු අදාළ කර ගත යුතු වේ.

**01.** හෙද සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1. හි **(iv)** හි සඳහන් වගන්තිය වෙනුවට පහත වගන්තිය අදාළ කර ගැනීමට කටයුතු කළ යුතු ය.
"රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම."

**02.** III ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

i. 2021.07.05 දිනට හෝ ඊට පෙර පූර්ව සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානය අනුව II ශ්‍රේණියට උසස්වීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති, එහෙත් එදිනට පෙර II ශ්‍රේණියට උසස්වී නොමැති නිලධාරින්ට පහත විධිවිධාන අදාළ කර ගත යුතු ය.

"පූර්ව සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානය අනුව, II ශ්‍රේණියට උසස්වීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති දිනයේ සිට 2021.07.05 දිනය දක්වා වන සක්‍රිය හා සතුටුදායක සේවා කාලය I ශ්‍රේණියට උසස් කිරීමේ දී II ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ලෙස සළකනු ලැබේ."

32a

**03.** I ශ්‍රේණියේ සිට අධිපන්තියට උසස් කිරිම

i. 9 වන සේවා ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන 2021.07.05 දිනට පෙර **I** ශ්‍රේණියට උසස්වී ඇති නිලධාරීන්, I ශ්‍රේණියේ වසර 07 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට හෙද සේවා ව්‍යවස්ථාවේ 10.3.1 **(i)** හි සඳහන් සුදුසුකම් හැර ඒ යටතේ වන අනෙකුත් සුදුසුකම් සලකා අධි ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

ii. 9 වන සේවා ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන 2021.07.05 දිනට පෙර II ශ්‍රේණියේ වසර 7 ක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්, අධි ශ්‍රේණියට උසස් කිරීමේ දී I ශ්‍රේණියේ වසර 07 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිතව හෙද සේවයේ වසර 22 ක ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට හෙද සේවා ව්‍යවස්ථාවේ 10.3.1 **(i)** හි සඳහන් සුදුසුකම් හැර ඒ යටතේ වන අනෙකුත් සුදුසකම් සලකා උසස් කරනු ලැබේ.

iii. 9 වන සේවා ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන 2021.07.05 දිනට පෙර අධිපන්තියට උසස්වී ඇති නිලධාරීන්ගේ, උපරිම වසර 3 ක කාලයකට යටත්ව I ශ්‍රේණියේ වසර 7 ට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලය, එම නිලධාරීන්ගේ අධි පන්තියේ සේවා කාලය ලෙස සළකනු ලැබේ. කෙසේ වුව ද මෙම විධිවිධානයන් අනුව අධිපන්තියට උසස්වීම් ලබා දී ඇති දිනයේ වෙනසක් සිදු කරනු නොලැබේ.

එස්.ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් -

**01.** සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරු - කරු. දැ.ගැ.ස හා අ.ක.ස.

**02.** සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු - කරු. දැ.ගැ.ස හා අ.ක.ස.

**03.** සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු.දැ.ගැ.ස.

**04.** සියළුම පළාත් සෞඛ්‍යසේවා අධ්‍යක්ෂවරු - කරු. දැ.ගැ.ස හා අ.ක.ස.

**05.** සියළුම පළාත් ආයුර්වේද කොමසාරිස්වරු- කරු. දැ.ගැ.ස හා අ.ක.ස.

**06.** සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු - කරු. දැ.ගැ.ස හා අ.ක.ස.